# ක්‍රිස්තු ධර්මය

## 9 වන ශ්‍රේණිය විෂය නිර්දේශය

| නිපුනතාවය | නිපුනතා මට්ටම |
|---|---|
| **1. දේව ඇදහිල්ල පදනම් කර ගනිමින් ධාර්මික ජීවිත ගත කරයි.** | 1.1 මානව ක්‍රියාකාරකම් තුළින් දේව නිර්මාණය වර්ධනයට යොමු වෙයි.<br>1.2 නිවැරදි මඟට යොමු වීම තුළින් දේව නිර්මාණය වර්ධනයට දායක වෙයි.<br>1.3 ධර්මිෂ්ඨ පාලනයක් ඇගයීම තුළින් දේව නිර්මාණය වර්ධනය කිරීමේ අභියෝගයට මුහුණ දෙයි.<br>1.4 ප්‍රඥාවෙන් ක්‍රියා කිරීමෙන් දේව නිර්මාණය වර්ධනයට සහය පල කරයි.<br>1.5 යහපත් නීති රීති පිළිපැදීම තුළින් දේව නිර්මාණය වර්ධනයට අතහිත දෙයි.<br>1.6 සම්පත් සාධාරණ ව හා නිසි ලෙස බෙදාගැනීම තුළ දේව නිර්මාණය වර්ධනයෙහි නියැලෙයි.<br>1.7 නූතන තාක්ෂණික දියුණුව තුළින් දේව නිර්මාණය වර්ධනය කිරීමට කටයුතු කරයි. |
| **2. ජේසුස් වහන්සේගේ ජීවිතය චරිතායනය කරයි.** | 2.1 කිතු උපත තුළින් ආලෝකවත් වී අඳුරු සමාජය ආලෝකවත් කරයි<br>2.2 ජේසුස් වහන්සේගේ ආලෝකය තුළින් ලද නව දැක්ම සමාජය වෙත ගෙන යාමට ක්‍රියා කරයි.<br>2.3 රූප විපර්යාසයේ ආලෝකය අත්දැකීම මගින් සමාජයට නව ආලෝකයක් ගෙන දෙයි.<br>2.4 ජේසුස් වහන්සේගේ ආලෝකයට සාක්ෂි දරයි.<br>2.5 ලෝකාලෝකය වූ ජේසුතුමාගේ ආලෝකයේ අඳුරු ස්ථාන ආාලෝකවත් කිරීමේ නියැලෙයි. |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

| නිපුනතාවය | නිපුනතා මට්ටම |
|---|---|
| **3. දේව රාජ්‍යයේ වර්ධනය හා උද්දීපනය සඳහා සමාජය තුළ කැපවීමෙන් ක්‍රියා කරයි.** | 3.1 ශුද්ධාත්ම බලයෙන් දිරිය ලබමින් දේව රාජ්‍යයේ වර්ධනයට හා උද්දීපනයට කැපවෙයි.<br>3.2 දේව රාජ්‍යයේ වර්ධනය හා උද්දීපනය සඳහා ශුද්ධාත්ම මගපෙන්වීමෙන් එඩිතර ව ක්‍රියා කිරීමේ අභියෝගයට මුහුණ දෙයි.<br>3.3 ශුද්ධාත්ම දීමනා යොදා ගනිමින් දේව රාජ්‍යයේ වර්ධනය හා උද්දීපනය සඳහා ක්‍රියා කරයි.<br>3.4 දේව අනාවරණය මගින් සමාජ පවිත්‍රතාවය ඇති කළ යෙසායා මෙන් දේව රාජ්‍යය වර්ධනය කිරීමට යොමු වෙයි.<br>3.5 සමාජ පරිවර්තනය සඳහා ශක්තිය ගෙන දුන් ජෙරමියා සේ ක්‍රියා කිරීමට පෙළඹෙයි<br>3.6 යුක්තිගරුක බව තුළින් සමාජ සාධාරණත්වය උදෙසා ක්‍රියා කළ ආමොස් ආදර්ශයට ගනියි.<br>3.7 මීකා විසින් ඉදිරිපත් කළ සාම දර්ශනය මගින් සාමය ඇති කිරීමට යොමු වෙයි.<br>3.8 හොෂියා මෙන් ප්‍රේමය තුළින් සමාව දානය කිරීමට පෙළඹෙයි. |
| **4. ස්වභාෂාවට පරිවර්තනය වූ ශුද්ධ බයිබලයෙන් නොමඳ ආත්මික පෝෂණයක් ලබයි.** | 4.1 ශුද්ධ වූ බයිබලය ලියැවුණු මුල් භාෂාවන් පිළිබඳ අවබෝධයක් ලබමින් බයිබලීය පණිවුඩයට අනුව ජීවත් වේ.<br>4.2 ශුද්ධ බයිබලයේ විශ්වීය ස්වභාවය පිළිගනිමින් සියළු ජාතීන් සමග සමගියෙන් කටයුතු කරයි.<br>4.3 ස්වභාෂාවන්ට පරිවර්තනය වූ ශුද්ධ බයිබලයේ පණිවුඩය වඩා පහසුවෙන් ග්‍රහණය කර ගනිමු.<br>4.4 ස්වභාෂාවෙන් රචිත ශුද්ධ බයිබලය තුළින් ආත්මික පෝෂණයට මග පෙන්වීමක් ලබයි.<br>4.5 ස්වභාෂාවට පරිවර්තනය වූ ශුද්ධ බයිබලයෙන් නොමඳ ආත්මික පෝෂණයක් ලබමින් මානව සහජීවනය සඳහා ක්‍රියා කරයි. |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.